# ECONOMIC GROWTH

# &

# DEVELOPMENT

# (Part-II)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of Sri Jayewardenepura***

# ආර්ථික සංවර්ධනය

ආර්ථික සංවර්ධනය පරිණාමන ක්‍රියාවලියක් වන අතර ආර්ථික වෘද්ධියක් සමඟ බැඳුණු ආර්ථිකයේ ව්‍යුහමය වෙනස් වීම් ඊට ඇතුළත් වේ.

ආර්ථික වෘද්ධිය ප්‍රමාණාත්මක පැතිකඩක් පමණක් වන අතර ආර්ථික සංවර්ධනයේ දී ප්‍රමාණාත්මක පැතිකඩට අමතර ව ගුණාත්මක ලක්ෂණ ද ඇතුළත් ය.

ClassWork.LK

## ආර්ථික වෘද්ධියත් සමග සිදුවිය යුතු ආර්ථික ව්‍යුහයේ ගුණාත්මක වෙනස්කම්

ආර්ථික සංවර්ධන ක්‍රියාවලියක දී ආර්ථික වෘද්ධියත් සමග ආර්ථික ව්‍යුහයේ පහත සඳහන් ගුණාත්මක වෙනස්කම් සිදු විය යුතු ය.

- කාර්මීකරණය වේගවත් වීම
- නිෂ්පාදන සම්පත්වල ඵලදායකත්වය ඉහළ යාම
- නිෂ්පාදන ශිල්ප ක්‍රම හා තාක්ෂණය උසස් වීම
- නවීකරණය වීම
- නිෂ්පාදන අංශයන්හි ව්‍යුහාත්මක වෙනස්කම් සිදු වීම
- දුගී බව, විරැකියාව අඩු වීම හා ආදායම් විෂමතාව නැති වීම

ClassWork.LK

# සංවර්ධනය

සංවර්ධනය බහුමාන ක්‍රියාවලියකි.

මිනිස් ජීවිතයේ ආර්ථික, දේශපාලන, සමාජීය හා සංස්කෘතික ආදි වශයෙන් සියලු ම පැතිකඩවල ප්‍රමාණාත්මක හා ගුණාත්මක වැඩි දියුණු වීමක් සංවර්ධනය යන්නෙන් අදහස් වේ.

මිනිසාගේ ජීවන තත්ත්වය අයහපත් තත්ත්වයක සිට යහපත් තත්ත්වයක් කරා වෙනස්වීම සංවර්ධනය යි.

ClassWork.LK

## ජීවන තත්ත්වය අයහපත් වීම කෙරෙහි බලපාන ප්‍රධාන සාධක

ජීවන තත්ත්වය අයහපත් වීම කෙරෙහි බලපාන ප්‍රධාන සාධක 5කි.

- භෞතික දෑ හිඟවීම
- ශාරීරික වශයෙන් දුර්වල වීම (රෝගී වීම)
- සමාජ සම්බන්ධතා අයහපත් වීම
- අනාරක්ෂිත භාවය
- බල රහිත වීම

සංවර්ධනය ආර්ථික, සමාජීය, දේශපාලන හා සංස්කෘතික වශයෙන් පැතිකඩ සමූහයක් සමඟ බැඳී පවතී.

ClassWork.LK

## ආර්ථික වෘද්ධිය හා සංවර්ධනය අතර වෙනස්කම්

ආර්ථික වෘද්ධිය හා සංවර්ධනය අතර පහත සඳහන් වෙනස්කම් හඳුනා ගත හැකි ය.

- ආර්ථික වෘද්ධිය මගින් ආර්ථිකය සතු නිෂ්පාදන ධාරිතාව ප්‍රසාරණය වීමක් පෙන්නුම් කරන අතර සංවර්ධනය මගින් ආර්ථිකයක වෙසෙන මිනිසුන්ගේ ජීවන තත්ත්වයේ යහපත් වර්ධනයක් පෙන්නුම් කරයි.

- ආර්ථිකයේ භාණ්ඩ හා සේවා පරිමාවේ හෝ ආදායමේ හෝ හටගෙන ඇති ප්‍රමාණාත්මක වැඩි වීම ආර්ථික වර්ධනය මගින් දක්වන අතර එම ආර්ථික වර්ධනයත් සමඟ මිනිස් ජීවිතවල සිදු වන ගුණාත්මක වර්ධනය සංවර්ධනය මගින් දක්වයි.

- ආර්ථික වර්ධනය මගින් පෙන්නුම් කරනුයේ රටක ප්‍රමාණාත්මක පැතිකඩ පමණි. සංවර්ධනය මගින් ප්‍රමාණාත්මක හා ගුණාත්මක පැතිකඩ යන දෙක ම පිළිබිඹු කෙරේ.

රටක ප්‍රතිශීර්ෂ ආදායම, මූර්ත දළ ජාතික නිෂ්පාදිතය ආදිය යොදා ගනිමින් රටක ආර්ථික වෘද්ධිය මිනුම් කළ හැකි ය.

ClassWork.LK

# මානව සංවර්ධනය

මානව සංවර්ධනය යනු මිනිසුන්ට තමන්ගේ මානව හැකියාවන් සම්පූර්ණයෙන් ම පුළුල් කර ගැනීමට මෙන් ම එකී හැකියාවන් ආර්ථික, සමාජ, සංස්කෘතික සහ දේශපාලන යන ක්ෂේත්‍රයන් හි උපරිම වශයෙන් භාවිත කිරීමට ඇති හැකියාව ලබා දීම සහ අනාගත පරම්පරාවට ද එම අයිතිය තහවුරු කිරීම යි.

මානව සංවර්ධනය විවිධ පැතිකඩ සහිත විවෘත සංකල්පයක් වන අතර එය ක්‍රියාවලියක් වශයෙන් එක් එක් පුද්ගලයන්ගේ උරුම හා හිමිකම් තත්ත්වයන් වෙන් කොට දක්වන්නා වූ ගෝලීය වශයෙන් සම්බන්ධ වූ දේශපාලන, ආර්ථික හා සංස්කෘතික ව්‍යුහයන් තුළ ක්‍රියාත්මක වේ. එයින් ජනතාව විසින් භුක්ති විඳිනු ලබන නිදහස නිර්ණය කෙරේ.

ClassWork.LK

# මානව සංවර්ධන පැතිකඩයන්ට අයත් වන අංශ

එම පැතිකඩයන්ට අයත් වන අංශ පහත දැක්වේ.

- ආදායම
- අධ්‍යාපනය
- සෞඛ්‍ය තත්ත්වය
- සවිබල ගැන්වීම
- දේශපාලන ස්වාධීන බව
- යහපත් සමාජ සම්බන්ධතා
- සමානතාව
- වැඩ කරන පරිසරය
- විවේක ගැනීමේ පහසුකම්
- දේශපාලන සුරක්ෂිත බව
- ආර්ථික නිදහස
- පාරිසරික ගුණාත්මක භාවය

ClassWork.LK

# තිරසර සංවර්ධනය

අනාගත පරම්පරාවලට තම අවශ්‍යතා සපුරා ගැනීමට ඇති හැකියාවට හානියක් නොවන ලෙස වර්තමාන පරම්පරාව තම අවශ්‍යතා සපුරා ගැනෙන සංවර්ධනය තිරසර සංවර්ධනය යි.

තිරසර සංවර්ධනය සඳහා ආර්ථික, සමාජීය හා පාරිසරක යන අංශ තුනෙහි ම තුලනාත්මක වර්ධනයක් සිදු විය යුතු ය.

# තිරසර සංවර්ධනයේ පැතිකඩ

- ආර්ථික පැතිකඩ
- පාරිසරික පැතිකඩ
- සමාජීය පැතිකඩ

ClassWork.LK

## පාරිසරික පැතිකඩ යටතේ සිදුවිය යුතු වර්ධනයන්

- මිනිසුන්ට හිතකර සනීපාරක්ෂක පරිසරය
- ප්‍රතිෂ්ඨාපනය කළ හැකි සම්පත් කාර්යක්ෂම උපයෝජනය කිරීම
- ප්‍රතිෂ්ඨාපනය කළ නොහැකි සම්පත් සුරැකීම

## සමාජීය පැතිකඩ යටතේ සිදුවිය යුතු වර්ධනයන්

- සාධාරණත්වය
- සමාජ සංචලතාව
- සහභාගිත්වය
- සමාජ සහජීවනය
- සවිබල ගැන්වීම
- සංස්කෘතික අනන්‍යතාව

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති

## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura